සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2022

**10 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

- **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයන්හි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.**

01. ඒ දර්ශනය දුටු මම <u>තක්බීරි වී</u> බලා සිටියෙමි.

(1) පුදුමයෙන් (2) සතුටින් (3) කනස්සල්ලෙන් යුතුව (4) බිහිරි බවින් යුක්තව

02. ඔහුට දන් <u>වැලේ වැල් නැති</u> බව මයුරි කීවා ය.

(1) මිය යාමට ආධාරකයක් නැති බව (2) විශාල ධන හානියක් සිදු වී ඇති බව

(3) ආර්ථික අමරුකම් ඇති බව (4) විශාල දුෂ්කරතා සහිත කාල සීමාවක් බව

03. පුංචි එතනා <u>ඉවක් බවක් නැතිව</u> කළ වියදම් නිසා පවුලේ පරිහානිය සිදු වූ බව සියල්ලෝ ම කල්පනා කරන්නට වූ හ.

(1) කිසිම විමසීමකින් තොරව (2) තිබුණ පලියට වියදම් කිරීම.

(3) අරපරිස්සමෙන් තොරව වියදම් කිරීම. (4) කල්පනාකාරී තත්ත්වයක් නොවීම.

- **අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

04. තමා විඳි රසය කෙබන්දක් දැයි ප්‍රකාශ කිරීම වූ කලී හැමදෙනාට ම කළ හැක්කක් නොවේ. ඊට ................................ අවශ්‍යය.

(1) ආත්මාන්වීක්ෂණය (2) අත්දැකීම් (3) ආස්වාදයක් (4) වින්දනයක්

05. භාෂාවක සජීවී බව, ඕජෝගුණය පළ කෙරෙන මෙවැනි ............................ යෙදුම ප්‍රස්තාව පිරුළු ලෙස නම් කරයි.

(1) සරල (2) සාම්ප්‍රදායික (3) පාරිභාෂික (4) විවේචනාත්මක

06. නාට්‍යයක ප්‍රකාශන විලාසය හෙවත් නාට්‍යය ඉදිරිපත් කරන ආකාරය ................................ නම් වෙයි.

(1) අභිනය (2) ශෛලිය (3) නාට්‍යපෙළ (4) නාට්‍යමය අවස්ථා

- **7 - 8 ප්‍රශ්නවල අකාරාදි පිළිවෙළ නිවැරදිව දැක්වෙන පද පේළිය තෝරන්න.**

07. (1) පන්නල, පත්තිරු, පල්ලිය, පස්යාල (2) කතරගම, කුරුණෑගල, කෑගල්ල, කොට්ටාව

(3) අමාවතුර, බුත්සරණ, පූජාවලිය, කව්සිළුමිණ (4) අකුරණ, අනුරාධපුරය, අම්පාර, අවිස්සාවෙල්ල

08. (1) කමනි, කමලා, කමල්, කමලනී (2) අන්තඃපුරය, ඉරණම, ඊශාන, එංගලන්තය

(3) සමනලයා, බත්කූරා, කණාමැදිරියා, මැස්සා (4) කීටයා, පණුවා, සුහුඹුලුවා, මදුරුවා

- **අංක 09 සිට 10 තෙක් ප්‍රශ්නවල සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදි වරණය තෝරන්න.**

09. (1) ප්‍රස්තාර, ප්‍රදර්ශනය, විශිෂ්ට, කොට්ඨාසය

(2) පුස්තකාලය, මර්දනය, අභිලාෂ, සම්ප්‍රධාන

(3) ඖෂධ, අර්ඝ, ලේඛන, ග්‍රහණය

(4) පරමාර්ත, දෘෂ්ටි, වීරෝදාර, සංස්කරණය

10. (1) ලේඛණ, සජ්ඣායනා, දෘෂ්ටි, ප්‍රස්තාර (2) ලේඛන, සජ්ඣායනා, දෘෂ්ඨි, ප්‍රස්තාර
(3) ලේඛන, සජ්ඣායනා, දෘෂ්ටි, ප්‍රස්තාරය (4) ලේඛණ, සජ්ඡායනා, දෘෂ්ඨි, ප්‍රස්තාරය

11. රකාරාංශය, ගයනුකිත්ත, රේඵය හා ඇලපිල්ල සහිත වචන අනුපිළිවෙළින් යෙදී ඇති පිළිතුර තෝරන්න.
(1) කුමන්ත්‍රණය, සෞඛ්‍යය, ආකර්ශනය, වෂීය (2) වජ්‍රාසනය, සෞන්දර්යය, කමීය, සැකය
(3) වෂීය, කෞතුකාගාරය, ව්‍රතය, නායකයා (4) සම්මන්ත්‍රණය, සෞන්දර්යය, වගීය, ආර්ථිකය

12. මුලින් දැක්වෙන පදයට විරුද්ධාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) උත්තම - අධම, නීච, අශිෂ්ට (2) සමාන - විෂම, අසමාන, අතුල්‍ය
(3) සංවර - අසංවර, නොසන්සුන්, නොදමුණ (4) කලකිරී - ප්‍රමෝදය, අසතුට, සන්තෝෂය

13. මුලින් දී ඇති පදයට සමානාර්ථවත් පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
(1) අනංගයා - මල්සරා, අනඟ, මින්දද, කාමදේව (2) සින්ධුප - මුහුද, සාගරය, වැව, සයුර
(3) මාගම - ස්ත්‍රිය, කාන්තාව, ගැහැනිය, ලඳ (4) පද්මය - සියපත, සරෝජ, සහස්පත, නෙළුම්

14. පහත අක්ෂර අතරින් අන්තඃස්ථාක්ෂර සේ සැලකෙන්නේ කුමන කාණ්ඩය ද?
(1) ක, ච, ට, ත, ප (2) ය, ර, ල, ව (3) ශ, ෂ, ස, හ, ෆ (4) ත, ථ, ද, ධ, න

- **අංක 15 සිට 18 දක්වා ප්‍රශ්නවල තදකළ අකුරෙන් මුද්‍රිත කොටසට වඩාත් සමීප අදහස සහිත වරණය තෝරන්න.**

15. ''පතසන් <u>අවරගිර</u> නැටියෙන් වැටෙන කළ''
(1) දහවල (2) පෙරදිග කන්ද (3) බස්නාහිර (4) නැගෙනහිර

16. වේදිකාවට බට අමුත්තාගේ <u>නරමුල්</u> දැක සෙස්සෝ සිනාසෙන්නට වූ හ.
(1) පැසුණු කෙස් (2) දත්මුල් (3) මුහුණ (4) රැළි වැටුණු මුහුණ

17. 'උන්වහන්සේ උදෙක් ම සබවස ප්‍රකාශ කරන්නෙමැ' යි උපාසක සිතුවේ ය.
(1) බොරු වචන (2) සැබෑ අරුත් (3) සත්‍ය වචන (4) සතර සංග්‍රහ වස්තු

18. <u>ආකස්මිකව</u> කිසිවක් හටනොගන්නා බව හොඳින් වැටහේ.
(1) බීජයකින් (2) හේතුවක් ඇතිව
(3) අහස්තලාවකින් තොරව (4) හේතු රහිතව

19. පහත ක්‍රියාපද පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
සැප මාලිගා සියල්ල <u>නැතිවේ වා!</u>
ඔබ මෙහි <u>එව</u>
එහි වැඩ <u>කරන</u> සියල්ලෝම පැමිණියහ.
ඇය <u>ආවොත්</u> මම ද එමි.
(1) ආශිර්වාද ක්‍රියා, විධි ක්‍රියා, කෘදන්ත ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා,
(2) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, කෘදන්ත ක්‍රියා, කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා
(3) ආශිර්වාද ක්‍රියා, විධික්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
(4) ආශිර්වාද ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

20. ගැළපෙන යුගල සහිත වරණය තෝරන්න.

| | | | |
|---|---|---|---|
| A | යක්කල | a. | පූර්වස්වර ලෝප සන්ධිය |
| B | උගත්තෝ | b. | ද්විත්ව රූප සන්ධිය |
| C | මරණාසන්න | c. | පූර්ව රූප සන්ධිය |
| D | අමාත්‍යාංශය | d. | ස්වරාදේශ සන්ධිය |

(1) Bd, Aa, Cb, Bc (2) Ac, Ba, Cd, Db (3) Bd, Aa, Cb, Dc (4) Ac, Bb, Ca, Dd

21. ආචාර්ය ටී. බී. ජායා ලිපිය නිර්මාණය කරන ලද්දේ,
(1) ආර්. සරණාසේකර මහතා. (2) ඒ. වි. සූරවීර මහතා.
(3) සිරිනිමල් ලක්දුසිංහ මහතා. (4) මහාචාර්ය වල්පොල රාහුල හිමි.

22. මොනරාගල ව්‍යාවහාරයට අනුව 'පුහුල්' යන්නෙන් අදහස් කරන්නේ කුමකට ද?
(1) ඉඟුරු සඳහාය. (2) වට්ටක්කා සඳහාය. (3) අඹ සඳහාය. (4) කිරි අල සඳහාය.

23. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වචන කාණ්ඩය තෝරන්න.
(1) නිපාත - ම, ලෙස, ලා, කැලම
(2) ස්වර සන්ධිය - මුලසුන, වමැස, නිලුපුල්, පිනැති
(3) උපසර්ග - විරචිත, අබල, අභිනන්දන, උමග
(4) අසම්භාව්‍ය ක්‍රියා - කියත, කරද්දී, තිබුණොත්, බැලුවා

24. නොගැළපෙන යුගලය පදය ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) තලා පෙළා (2) කරකියා (3) තුටුපහටු (4) බාලමහලු

25. වැරදි ලෙස විසන්ධි කර ඇති පිළිතුර තෝරන්න.
(1) කිරිමැටි + යාන (2) වීර + එක් (3) හේතු + අර්ථ (4) පීතෘ + අර්ථ

26. පුර පසළොස්වක හා අමාවක අතර හඳ කෙමෙන් මැකී යන කාලය හඳුන්වන්නේ,
(1) පුරපක්‍ෂය ලෙසය. (2) අවපක්ෂය ලෙසය.
(3) කෘෂ්ණ පක්‍ෂය ලෙසය. (4) ශුක්ල පක්ෂය ලෙසය.

27. පහත දී ඇති පද යුගලවල අර්ථය වරදවා දී ඇති පදයක් සහිත වරණය තෝරන්න.
(1) පුපුරැටි - පුපුරු වැනි වූ
පිටවක - පිටෙහිවකය
(2) අධිවාසනා - ඉවසීමේ ගුණය
ඇළව යා - ඉවතට යන්න
(3) කිහිඹියකට - කුහුඹවකට
පරිපෝෂිත - මනාව පෝෂණය වූ
(4) උක්තීන් - කියමන්
සර්වාංගය - සියලු අංශයන්

28. A, B, C, D යෙදුම යුගල අතරින් නිවැරදි යුගල වන්නේ,
A - විද්‍යාත්මක සොයාගැනීම සහ දැනුම මිනිසාගේ ප්‍රායෝගික භාවිතය සඳහා යොදා ගැනීම අරමුණු කරගත් විද්‍යාව ව්‍යාවහාරික විද්‍යාව ලෙස කියනු ලැබේ.
B - 'ර' කාරංශයට පසුව යෙදෙනුයේ 'න' යන්න වේ.
C - විසර්ගය ස්වර අක්ෂර ගණයට අයත් වේ.
D - උපමානය යන්න උපමාවට කියන තවත් නමකි.
(1) A හා D පමණි (2) B හා D පමණි (3) A හා C පමණි (4) B හා C පමණි

- **අංක 29 හා 30 යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.**

29. උත්පත්තියෙන් ආ දුර්ගුණයන් ඉවතලිය නොහැකි බව.
(1) ඌරන්ට මොන අච්චාරු ද?
(2) කුස රජ්ජුරුවොත් වසුත් කද ඇද්දලු.
(3) උපන්ගෙයි සිරිත බලි ඇරියත් යන්නේ නැති ලු.
(4) ඉබ්බා දියේ දැම්මා ම ඇන්නැවේ කිව්වලු.

30. දී ඇති වචන ගොනු අතරින් අන්‍යෝන්‍ය වශයෙන් ළංවන කාර්යයක් සමග බැඳී නොපවත්නා ලද වචනයක් සහිත පද පේළිය වන්නේ,
(1) හත්ථිපාකාර, පිටමළුව, වාලුකාංගණ, චෛතියසර
(2) උබර, කලවිට, උදලු ගොයියා, අක්වැස්ස, අලුත් සහල් මංගල්‍යය
(3) වල් ඇල්ලීම, අත්කම් ක්‍රමය, අක්වැස්ස, චේන
(4) වපුරව්වා, නැතුං, කොය්, මක්කෙයි.

- **අංක 31, 32 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.**

31. (1) ඔවුන් රටේ ජෝෂ්ඨ පුරවැසියෝ වෙති.
(2) එම විද්‍යාලයේ දක්ෂ සිසුන් ඇත.
(3) මුරකරුවන් සත්‍ය ප්‍රකාශ කළහ' යි කවුරු විශ්වාස කරත් ද?
(4) පුරාතනයෝ දෙවිදේවතාවෝ පිදූහ.

32. (1) එක් අයෙක් වරද පිළිගත් හ.
(2) කවුරුන් මෙවැනි ක්‍රියාවෝ කරත් ද?
(3) මා විසින් පුවත්පතක් බලන ලදී.
(4) සියලු ඥාතිමිත්‍රාදීන් මේ නිවේදනය පිළිගනිත්වා.

33. (1) පයින් යන්නෝ පදික වේදිකාවෙන් ගමන් කළ යුතු ය.
(2) ඔවුහු තුමූ සතුටින් වේදිකාව මත පය තැබූ හ.
(3) නදී තොමෝ සෙමෙන් සෙමෙන් ගලා බසිති.
(4) ඔවුන් නිදහස පතා සටන් කළ යුත්තෝ ය.

34. ''නිශ්ශබ්ද වෙනු ! උබෙන් මොකුත් ගත්තෙ නෑ නේ ද?'' අරක්කැමි ඔහුගෙන් (පුංචප්පු) ප්‍රශ්න කළේ ය.
මෙහි ඇතුළත් නොවන විරාම ලකුණ කුමක් දැයි තෝරා ලියන්න.
(1) වරහන් (2) යුගල උඩුකොමා (3) හර්ෂයාදි ලකුණ (4) කොමාව

35. පහත දක්වා ඇති කවියේ තුන්වැනි පදය තෝරා දක්වන්න.

වලාකුළේ රන් පාටට විදුලි කොටනවා
ආකාසේ හඬ තලමින් අකුණු හඬනවා
.....................................................................................................
හෝ ගාමින් අපේ ගමට වැස්සක් එනවා

(1) බිංදු බිංදු මහ පොළොවට වතුර වැටෙනා
(2) ගල් ගහන්නා වාගේ වතුර කැට වැටෙනවා
(3) කළුවලා කැළඹෙමින් මුදුන් වී නැගෙනවා
(4) අකුණු ගෙඩි ගිගුම් දී විදුලි ඉරි දුවනවා

36. අනුක්ත පද දෙකක් හා උක්ත පද දෙකක් ඇති වරණය තෝරන්න.
(1) තා, ගුරුවරයෙක්, වෛද්‍යවරුන්, දරුවෙකු (2) ළමයින්, ඇතින්නියක්, තොප, ගැහැනියක්
(3) රජවරුන්, සිසුන්, ඕ තොමෝ, නායකතුමන් (4) රීතිහු, නීතින්, ඔවුන්, මැණියන්

37. පහත සඳහන් පාඨ අතරින් උපමාවක් යෙදී නොමැති වාක්‍ය වනුයේ,
(1) රත් වැ ගිය යටව වැනි ඇස් ඇති ....
(2) එතෙපුල් නමැති අමාහැල්ලෙන් කෝ ගිනි කඳ නිවී ගිය....
(3) අබසැට ලාසක් පුපුරන ලෙසිනි.
(4) රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළ දි දී ....

38. පහත දී ඇති වචන අතුරින් අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි ග්‍රන්ථ කර්තෘ නම ඇතුළත් වරණය තෝරන්න.
(1) නොසුයුර්කෙ (2) ණගුදාඅසරාසේමක (3) ආයරිංවශවීණරස (4) යපිනසේගමකහඳයේ

39. ''උඹේ මුද්ද අත් ඔරලෝසුව පැන
ඇයි රත්තරන් පුතුනේ එච්චේ මොට ද?
නිසඳැස් පද්‍ය රචනා කරන ලද්දේ,
(1) මහගමසේකර මහතා (2) රත්න ශ්‍රී විජේසිංහ (3) විමල් දිසානායක (4) ගුණදාස අමරසේකර

40. කුඹුයොත් සයුරු බොත එහි මිණි සේ අනත
නුබ කැට තෙලෙහි දිසි මෙන් තුරු පහන් වත
ඉහත කවියේ අර්ථය නිවැරදිව දැක්වෙන අර්ථය වනුයේ,
(1) අගස්ති ඍෂිවරයා සාගරයේ ඇති ජලය තම අතට ගෙන පානය කරන විට පතුලෙහි තිබූ බොහෝ මැණික්වල ඡායාව ආකාශය නමැති කැටපතෙහි දිස්වූවාක් මෙනි.
(2) කුඹුයොත් තමාගේ අත්ලට ගත් ජල ධාරාව බීමට පටන් ගත. එහි දී ජල බිංදු මැණික් කැට මෙන් දිස්විය.
(3) කුඹුයොත් නමැති දෙවියා තමාගේ අත්ලෙහි තිබූ ජලය පානය කරනවිට නුඹකැට සාගරයේ දිස් වූයේ කැටපතක් ලෙස ය.
(4) අගස්ති ඍෂිවරයා සාගරයේ ඇති ජලය තම අතෙහි රුවාගෙන පානය කරන විට ආකාශය නමැති කැඩපතෙහි තරුකැට දිස් විය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2022

## 10 ශ්‍රේණිය සිංහල භාෂාව හා සාහිත්‍යය - II කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු 80 කි.

- අංක **(i)** සිට **(x)** තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(01) (i) අර්ධ ස්වර දෙකක් ලියන්න.

(ii) පහත වචනවල අක්ෂර වින්‍යාසය වැරදිය. එය නිවැරදි කර ලියන්න.
(අ) ස්වේත ඡත්‍රය (ආ) ප්‍රස්ථාව පිරුළු

(iii) පහත දී ඇති පාඨවල උපමානය හා උපමේය වෙන්කර දක්වන්න.
(අ) කිරිබිඳුවක් ලෙසින් ශ්‍රී ලංකාව සිතියම මත සිත්තම්ව ඇත.
(ආ) විලිකුන් සුරත් පල වැනි වේ රිවි මඬල

(iv) පහත වාක්‍ය වැරදි නම් <u>නිවැරදි</u> කර ලියන්න.
(අ) සභාතොමෝ සතුටින් විසිර ගිය හ.
(ආ) ශ්‍රී ලංකා වැසියෝ වර්තමානයේ බලාපොරොත්තු වන්නේ මොනවා ද?

(v) පහත වාක්‍යයේ ඇති නිපාත පද දෙකක් උපුටා ලියන්න.
''ඉතින් මහත්තයෝ, ඕවා අද ඊයේ වෙන දේවල් යෑ?
ආදී කාලේ හිටන් ම ඕවා වුනා නෙව ...'' ?

(vi) පහත වාක්‍යයේ ඇති උපසර්ග පද දෙකක් උපුටා ලියන්න.
සුපිපිමලක් මෙන් සුන්දර යුවතිය විරල රෝගයෙන් අසාධ්‍ය ව මිලාන වූ කුසුමක් මෙන් දිස්විය.

(vii) පහත සඳහන් පද සන්ධි කරන්න.
(අ) ගඟ + වතුර (ආ) ග්‍රාම + උදය

(viii) පහත සඳහන් වාක්‍ය කර්ම කාරක වාක්‍ය බවට හරවන්න.
(අ) අපි මව්පියන් නමදිමු.
(ආ) පුරාණ මිනිස්සු දෙව් දේවතාවුන් පිදූහ.

(ix) පහත දැක්වෙන අදහස් සඳහා උචිත රූඪී පද ලියන්න.
(අ) දැඩි පිපාසයක් ඇති වුණා -
(ආ) කීර්තිය, ගෞරවය නැතිව යාම -

(x) සුදුසු පරිදි විරාම ලකුණු යොදා නැවත ලියන්න.
මම ද අදහස් දැක්වුයෙමි මා මේ දේශගුණික ආපදාවලට උදාහරණ විදිහට නියඟ ජලගැලීම් එහෙම කියන්න පුළුවන් නේ ද

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන කොටස්වලින් එකක් තෝරාගෙන වචන 250 කට නො අඩු වනසේ රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) රටක ජනතාවගෙන් වැඩි පිරිසක් එමෙන්ම සිංහල හා ද්‍රවිඩ ජනතාව එකම දිනක එකම වේලාවකම සමරන උත්සවයකි. සිංහල හා දෙමළ අලුත් අවුරුදු ජාතික උත්සවය. ඒ හා බැඳුණු සිරිත් විරිත් හා සාරධර්ම ඔබ දකිනා අන්දම විස්තර කරමින් රචනයක් ලියන්න.

(ආ) ජලය ස්වභාවික සම්පතකි. එහෙත් අද වන විට එය මිල දී ගත යුතු තත්වයට පත් ව ඇත. ජලය පරිභෝජනය කරන්නෝ විවිධ දුෂ්කරතාවලට මුහුණු දෙති. සැබැවින් මනා ජලකළමනාකරණයක අවශ්‍යතාව පැන නැගී ඇත. එමගින් ජල සම්පත සුරක්ෂිත කිරීමට ද හැකි වේ.

(ඉ) අධ්‍යාපනයේ පදනම කියවීමයි. සෑම පාසලක ම පුස්තකාලයක් තිබිය යුතු ය. යන්න විද්වතුන්ගේ මතයයි. පොත පත කියවීමෙන් තොරව පන්ති කාමරයේ ඉගෙනීමෙන් පමණක් ප්‍රාඥයෙකු විය නො හැකිය. ළමාකාලයේ සිට ම කියවීමට හුරු කිරීමෙන් ඊට අදාළ පහසුකම් වර්ධනයත් ඉදුරාම සිදුවිය යුතු ය.

(ඊ) තවත් වසරකින් අ. පො. සා. පෙළ කඩඉම පසුකරන ඔබගේ ඉලක්කය කුමක් ද? එය ජයගැනීමට ඔබ අධිෂ්ඨාන කර සිටින්නේ කෙසේ ද? යන්න විස්තර කරමින් ''මගේ අනාගත පැතුම'' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(03) පහත සඳහන් ඡේදය වචන 50 - 55 අතර ප්‍රමාණයකින් සාරාංශ කරන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

බොහෝ දෙමාපියන්ගේ අභිලාෂය වී ඇත්තේ තම දූ දරුවන්ට ලබා දෙන අධ්‍යාපනය මගින් ඔවුන් සමාජය තුළ ප්‍රභූ වෘත්තීන් ලෙස සැලකෙන වෛද්‍ය, ඉංජිනේරු, කළමනාකරණ වැනි වෘත්තිය ක්ෂේත්‍රවල වෘත්තිකයන් බවට පත්කර ගැනීමයි. මේ නිසා අද වනවිට එවන් වූ වෘත්තීන් සඳහා ඇති සීමිත අවකාශය තුළ විශාල තරගකාරී බවක් නිර්මාණය වී ඇත. මෙවන් වූ වටපිටාවක් තුළ බොහෝ දෙනෙකුගේ අවධානය යොමුවන්නේ අධ්‍යාපනය ඇසුරෙන් ලබන්නා වූ බුද්ධිවර්ධනය හා තරග විභාග ජය ගැනීම කෙරෙහි පමණකි. ඒ තරග විභාගවලින් උසස් ප්‍රතිඵල ලබා ප්‍රභූ වෘත්තීය ක්ෂේත්‍ර සඳහා වූ සීමිත අවකාශය වෙතට ඇතුළු වීමට ඔවුහු වෙර දරති.

අප බොහෝ දෙනෙකුගේ අවධානය හසුනොවන භයානක යථාර්ථයක් ඇත. එනම් බුද්ධි වර්ධනය පමණක් අරමුණු කරගත් තරග විභාගවලින් ඉහළ ප්‍රතිඵල ලබන ඇතැම් අය පසු කාලයක දී රැකී රක්ෂාවල දී මෙන් ම සමාජ ජීවිතයේ දී ද අසාර්ථක පුද්ගලයන් බවට පත්වන බව මේ වනවිටත් පිළිගත් සිද්ධාන්තයක් බවට පත්වී ඇති බව ය. මේ කරුණ සනාථ කිරීම සඳහා පරීක්ෂණ මත පදනම්වුණු සාක්ෂි බටහිර මනෝවිද්‍යාවෙහි එමට ය.

(04) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කෝට්ටේ යුගය සිංහල සාහිත්‍ය ඉතිහාසයේ ස්වර්ණමය යුගය වශයෙන් හැඳින්වෙන්නේ එම යුගයේ බිහි වූ විශිෂ්ට ධර්ම ග්‍රන්ථ, ශාස්ත්‍රීය ලේඛන හා නිර්මාණ ග්‍රන්ථ සමූහය සැලකීමෙනි. ඒ අතර පරවි සංදේශය හා සැළලිහිණි සංදේශය තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් රචනා කරන අතරතුර වනවාසි ගුරුකුලයේ වීදාගම මහා මෛත්‍රී හිමියන් හංස සංදේශය, ලෝවැඩ සඟරාව බුදුගුණ අලංකාරය වැනි ග්‍රන්ථ රචනා කළේ ය. රහුල හිමියන්ගේ අනෙක් නිර්මාණය වූයේ කාව්‍යශේඛර මහා කාව්‍යය බුද්ධි ප්‍රසාදිනි ටීකාව සහ පංචිකාප්‍රදීපයයි. ගුත්තිල කාව්‍යය ඛණ්ඩ කාව්‍යයක් සේ රචනා කළේ වැත්තෑවේ හිමියන් ය.

මේ අවධියේ දේශපාලනික හා සමාජ වාතාවරණය ද සාපේක්ෂව ස්ථාවර මුහුණුවරක් ගත්තේ ය. අවසන් වරට රට එක්සත් කළ නරපති වූයේ vi වෙනි පැරකුම්බා රාජ්‍ය සමය ස්ථාපිත වීමත් සමඟ ය. රජතුමා සාහිත්‍ය කලාව කෙරෙහි විශේෂ රාජ්‍ය අනුග්‍රහයක් සැපයූ අතර විශිෂ්ට ශාස්ත්‍රඥයන් ග්‍රන්ථාකරණයෙහි ලා උත්සුක කරවනු ලැබූ ආකාරය ද සඳහන් වෙයි.

(i) සිහංල සාහිත්‍ය ඉතිහාසයේ ස්වර්ණමය යුගය කුමක් ද?

(ii) වීදාගම මහා මෛත්‍රී හිමියන් රචනා කළ ග්‍රන්ථ මොනවා ද?

(iii) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් රචනා කළ මහා කාව්‍ය කුමක් ද?

(iv) මෙම අවධියේ දේශපාලන, සමාජවාතාවරණය කෙබඳු ද?

(v) මෙහි දැක්වෙන ටීකා ග්‍රන්ථයක් සහ ඛණ්ඩකාව්‍යයක් නම් කරන්න.

(05) (අ) ශ්‍රාවස්තිපුර, මූණමල්දෙණිය ගම් ප්‍රදේශය හරහා වැටී ඇති ප්‍රධාන මාර්ගය බොහෝ කාලයක සිට අබලන්ව පවතියි. මේ නිසා ප්‍රදේශවාසීහු ඉමහත් අසීරුතාවයකට පත්ව සිටිති. එම මාර්ගය පිළිසකර කර දෙන ලෙස ඉල්ලා මූණමල්දෙණිය, ප්‍රාදේශිය සභාවේ සභාපති වෙත ලිපියක් ලියන්න. (මෙහි දී ඔබ මූණමල්දෙණිය ග්‍රාමෝදය සමිතියේ ලේකම් යැයි සිතන්න.) වචන 100 පමණ සෑහේ.

**නැතහොත්**

ඔබේ පාසලේ සිංහල සාහිත්‍ය සමිතිය නව මුහුණුවරක් ගෙනයාම සඳහා සිසුන් දැනුවත් කිරීමේ අරමුණින් අත්පත්‍රිකාවක් සකස් කරන්න.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2022

10 ශ්‍රේණිය **සිංහල භාෂාව හා සාහිත්‍යය - III** කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් ප්‍රශ්න එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80 කි.

(01) (i) සිට (x) තෙක් සියලු ම අනු කොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනු කොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) පන්සිය පනස් ජාතක පොත ලියවුණු සියවස සඳහන් කරන්න.
(ආ) ඉහත ජාතක පොත ලිවීමට අනුග්‍රහය දක්වූ අමාත්‍යවරයා කවුරුන් ද?

(ii) (අ) ගුත්තිල කාව්‍ය ලිවීමට මූලාශ්‍ර වූ කතාව කුමක් ද?
(ආ) ගුත්තිල කාව්‍යයේ කතුවරයා කවුරුන් ද?

(iii) (අ) බැද්දේගම නවකතාවේ මුල් කෘතිය කුමක් ද?
(ආ) බැද්දේගම නවකතාව ලියවුණු වර්ෂය සඳහන් කරන්න.

(iv) (අ) එච්. එම්. කුඩලිගම කවියා සංස්කරණය කළ කවි සඟරාව කුමක් ද?
(ආ) එච්. එම්. කුඩලිගම කවියා ලියූ කාව්‍ය කෘති දෙකක් ලියන්න.

(v) ''මේ සියල්ල හැරදා මම ආවෙමි වලටා''
(අ) මේ ප්‍රකාශය ඇතුළත් කෘතිය කුමක් ද?
(ආ) මෙම ප්‍රකාශයේ ඇතුළත් මම යනු කවුරුන් ද?

(vi) (අ) එස්. මහින්ද හිමි කවි ලියූ ප්‍රධාන තේමා දෙකක් ලියන්න.
(ආ) එස්. මහින්ද හිමිගේ මුල් ම කාව්‍ය කෘතියේ නම කුමක් ද?

(vii) ..............................................................
..............................................................
අනුන් ලියන් දැක තම ලියට තල තලා
දුවන මුවන් දැක නොදමවි නෙළුව පලා
(අ) ඉහත කවියේ මුල් පද සම්පූර්ණ කරන්න.
(ආ) මේ කවි හඳුන්වන කාව්‍ය ප්‍රවර්ගය කුමක් ද?

(viii) ''රජ්ජුරුවන්ට පටහැනිවීම නම් යුක්ත නොවෙයි.''
(අ) මේ කාගේ සිතිවිල්ලක් ද?
(ආ) මෙහි සඳහන් රජතුමාගේ නම කුමක් ද?

(ix) පහත සඳහන් කෘතිවල කතුවරු නම් කරන්න.
(අ) නන්දන ගීත
(ආ) පිං ඇති සරසවි වරමක් දෙන්නේ,

(x) අනුවණකම් කළේ
ගුරුන් ගුණ සිහිනො කෙළේ
.....................................................
.....................................................
(අ) ඉහත කවියේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.
(ආ) මෙම කවිය ඇතුළත් කෘතියේ ඇති සම්පූර්ණ කවි ගණන කීය ද?

(ලකුණු 2 × 10 = 20 යි)

(02) පහත සඳහන් ගද්‍ය පද්‍ය කොටස් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) තමාට කොටගොඩ නැදෑයන්ගෙන් ඉඩම් කැබැල්ලක් ලබා ගත හැකි බවත් එහි දී දූ දරුවන්ට හිර හිඳලන් ගැනීම වඩා හොඳින් කර ගත හැකි බවත් ඈ දැන සිටියා ය.

(අ) ඉරි ඇඳි පදයේ තේරුම ලියන්න.

(ආ) මෙසේ සිතූ අය ඊ ළඟට කළේ කුමක් ද? (පේළි දෙකකින් පමණ ලියන්න)

(ii) සිනිඳු මොළොක් බව මලෙහී
පිරිසිඳු බව පිනි බිඳෙහී
එක් වී මා පුතුගෙ ළෙහී
අරක් ගනී හැම දිනෙහී

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ආ) පසුව මුළු කවියේ ම අර්ථය ලියන්න.

(iii) ගොස් සෙදින මම සොයනෙමි වන පෙත
සියලු ම ගම රට නරකැල හැසිරෙන

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ආ) මෙසේ ප්‍රකාශ කිරීමට හේතුව කුමක් ද?

(iv) කඳු බෑවුමක දං බෝවිටි පඳුරු තලා
පහළට ඇදී පරමල් පෙති ඉවත නොලා
කලදෝ දියෙන් පොඟවා රන් පුලින තලා
සංගීතවත් වී යම් ඉදිරියට ගලා

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ආ) පසුව මුළු කවියේ ම අර්ථය ලියන්න.

(v) කේවට්ටයෝ ද තමන්ගේ බස් රජ්ජුරුවන් සිතට නංවා ගත නොහී, රජ්ජුරුවන්ට පටහැණි වීම නම් යුක්ත නොවෙයි සිතා, රජ්ජුරුවන් හා සමග නික්මුණා හ.

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ආ) කේවට්ට බමුණා රජ්ජුරුවන් සමග නික්මුණේ කුමක් සඳහා ද?

(ලකුණු 4 × 5 = 20 යි)

(03) (i) ප්‍රබල සංවාද භාවිතයත්,

(ii) අවස්ථෝචිත උපමා භාවිතයත් නිසා, උම්මග්ග ජාතකය රසවත් කතාවක් වී ඇති ආකාරය නියමිත කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

(i) සරල ව්‍යවහාර භාෂාව ද,

(ii) උගත් කවි බස ද, මැනවින් සංකලනය කළ අපූර්ව කාව්‍යයක් ලෙස ගුත්තිල කාව්‍ය හැඳින්විය හැකිය. ඔබට නියමිත කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් මේ කියමන පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

(04) (i) දේශානුරාගය දනවීමත්,

(ii) චරිත සංවර්ධනයට මග පෙන්වීමත්,

ජාතික තොටිල්ල පද්‍ය නිර්මාණයෙන් සිදු වේ. නියමිත කවිවලින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් මේ කියමන විමසන්න.

**නැතහොත්**

(i) අවස්ථා හා සිද්ධි නිරූපණයේ ප්‍රබල බවත්,

(ii) සජීවී ලෙස භාෂාව භාවිතයත් නිසා බැද්දේගම නවකතාව සාර්ථක කතාවක් වී ඇති ආකාරය ඔබට නියමිත කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.(ලකුණු 15 යි)

(05) යහපත් ජීවිතයක් සඳහා උපදේශ කවිවලින් ගත හැකි ආදර්ශය ''හානාහීය පානා අඬහැරෙන් දනේ'' පාඩමින් උදාහරණ තුනක් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

(06) සිංහයා දරුවන් කෙරෙහි අසීමිත පීතෘ සෙනේහයෙන් යුතු අයෙකි. ලෙන අතහැර යාම පාඩමින් උදාහරණ තුනක් දෙමින් මේ කියමන පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

(07) අජීවී පරිසරයට සජීවී බවක් ආරෝපණය කළ නිර්මාණාත්මක පැදිපෙළක් ලෙස ගංගාවේ සංගීතය පැදිපෙල හැඳින්විය හැකි ය. උදාහරණ තුනක් දෙමින් මේ කියමන සාකච්ඡා කරන්න. (ලකුණු 10 යි)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1 - (1) | 11 - (4) | 21 - (3) | 31 - (3) |
| 2 - (3) | 12 - (4) | 22 - (2) | 32 - (3) |
| 3 - (3) | 13 - (2) | 23 - (4) | 33 - (2) |
| 4 - (1) | 14 - (2) | 24 - (2) | 34 - (4) |
| 5 - (2) | 15 - (3) | 25 - (1) | 35 - (1) |
| 6 - (2) | 16 - (1) | 26 - (2) | 36 - (2) |
| 7 - (4) | 17 - (3) | 27 - (4) | 37 - (2) |
| 8 - (2) | 18 - (4) | 28 - (1) | 38 - (1) |
| 9 - (1) | 19 - (1) | 29 - (3) | 39 - (4) |
| 10 - (3) | 20 - (4) | 30 - (4) | 40 - (1) |

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

## II පත්‍රය

01 (i) යරලව (ii) (අ) ශ්වේත ඡත්‍රය (ආ) ප්‍රස්තාව පිරුළු

(iii)

| උපමානය | උපමේය |
|---|---|
| කිරිබිඳුවක් | ශ්‍රී ලංකාව |
| විලිකුන් සුරත්පල | සූර්යයා |

(iv) (අ) සහාතුමු සතුටින් විසිර ගියහ. (ආ) ශ්‍රී ලංකා වැසියන් බලාපොරොත්තු වන්නේ මොනවා ද?

(v) ඉතින්, අද, ඊයේ , ම (vi) සුපිපිමලක්, විරල, අසාධ්‍ය (vii) (අ) ගංවතුර (ආ) ග්‍රාමෝදය

(viii) (අ) අප විසින් මව්පියෝ නැමදෙති / නමදිනු ලබති / ලබත් / ලැබෙති

(ආ) පුරාණ මිනිසුන් විසින් දෙවි දේවතාවෝ පුදනු ලැබූහ / ලැබූවෝය.

(ix) (අ) දිවගිලෙන්න ආවා (ආ) සායම ගියා / මූණේ දැලි ගෑවා

(x) මම ද අදහස් දැක්වූයෙමි. ''මාමේ දේශගුණික ආපදාවලට උදාහරණ විදිහට නියඟ, ජලගැලම් එහෙම කියන්න පුළුවන් නේද?''

(02) රචනය

| | | |
|---|---|---|
| 01 | සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළුව | ලකුණු 08 |
| 02 | සංවිධානය, නිර්මාණාත්මභාවය හා ස්වීයත්වය | ලකුණු 12 |
| 03 | ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා බෙදීම | ලකුණු 05 |

මුළු ලකුණු 25 යි.

(03) සාරාංශය

- අන්තර්ගතය (ප්‍රධාන අදහස් සඳහා) - ලකුණු 06
- වචන ගණන - ලකුණු 02
- ශිල්පීය දක්ෂතා - ලකුණු 02

මුළු ලකුණු 10 යි.

අන්තර්ගතය

- ★ දෙමාපියන්ගේ අභිලාෂය තම දූදරුවන්ට අධ්‍යාපනය මගින් ප්‍රභූ වෘත්තිකයන් බවට පත් කිරීමයි.
- ★ සීමිත අවකාශය තුළ තරඟකාරී බවක් නිර්මාණය වීම.
- ★ මේ නිසා අධ්‍යාපනයෙන් තරඟ විභාග ජය ගැනීමට පමණක් සීමා වීම.
- ★ බුද්ධිවර්ධනය පමණක් අරමුණු වීම.
- ★ ඇතැම් අය බොහොවිට රැකි රක්ෂාවල දී හා සමාජ ජීවිතයේ අර්ථක පුද්ගලයන් බවට පත්වීම.
- ★ මෙම කරුණු සාක්ෂි සහිතව බටහිර මනෝවිද්‍යාවේ ඔප්පු කර හමාරය.

(04) (i) කෝට්ටේ යුගය (ii) හංසය, බුදුගුණ අලංකාරය, ලෝවැඩ සඟරාව (iii) කාව්‍යශේකරය

(iv) සාපේක්ෂ වශයෙන් ස්ථාවර මුහුණුවරකි. (v) බුද්ධ ප්‍රසාදිනී ටීකාව හා ගුත්තිල කාව්‍ය (ලකුණු 2 × 5 = 10)

(05) ලිපිය - ★ ආකෘතිය - ලකුණු 05

යවන්නාගේ නම ලිපිනය දිනය - ලකුණු 01
ලබන්නාගේ ලිපිනය - ලකුණු 01
අමන්ත්‍රණය - ලකුණු 01
මාතෘකාව - ලකුණු 01
තනතුර හා අත්සන - ලකුණු 01

★ අන්තර්ගතය - ලකුණු 07

★ ශිල්පීය දක්ෂතා - ලකුණු 03

මුළු ලකුණු 15

අත්පත්‍රිකාව

- ආකෘතිය සඳහා - ලකුණු 05 යි
  - මාතෘකාව - ලකුණු 01
  - පළකරන්නාගේ නම තනතුර - ලකුණු 01
  - පළකරන දිනය - ලකුණු 01
  - නිර්මාණාත්මක බව - ලකුණු 02
  - මුළු ලකුණු 05
- අන්තර්ගතය - ලකුණු 07 යි
- ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි

මුළු ලකුණු 15 යි

## III පත්‍රය

(01) (i) (අ) 14 වෙනි සියවස (ආ) වීරසිංහ පතිරාජ

(ii) (අ) ගුත්තිල ජාතකය (ආ) වෑත්තෑවේ හිමි

(iii) (අ) Village in the jungle (විලේජ් ඉන් ද ජන්ගල්) (ආ) 1913

(iv) (අ) සුවඳ (ආ) කුණාටුව / ඈ / සංවාදය / එකෝමත් එක රටක

(v) (අ) සිංහ බාහු (ආ) සුප්පා දේවි

(vi) (අ) ළමයින් උදෙසා ලියූ කවි / දේශානුරාගී හා ජාතිකාභිමානි කවි / බුද්ධාභි වන්දනා කවි
(ආ) ඔවා මුතු

(vii) (අ) අඳුර කරුවලේ පඳුරට මුවා වෙලා
විදුලිය එළිය දැක ගිනිහුල දියේ හෙලා
(ආ) දැනමුතුකමට කී කවි / උපදෙසි දී සඳහා කී කවි / උපදේශ ජන කවි

(viii) (අ) කේවට්ට බමුණාගේ (ආ) චූලනී බ්‍රහ්මදත්ත රජ

(ix) (අ) එස්. මහින්ද හිමි (ආ) මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර

(x) (අ) නද ඉන් නොපතලේ (ආ) 511 යි
අයසමය මුළු දියත පතලේ

(02) (i) (අ) අවාහ විවාහ / දීගතලග / යන අදහස එන පිළිතුරක්
(ආ) තමාගේ ඥාතීන් සිටින කොටගොඩ ගමට දරුවන් සමග යාම (යන අදහස )

(ii) (අ) ලෙහී = ළයෙහි / පපුවෙහි / හදවතෙහි
අරක්ගනී = හදවතෙහි තැන්පත් වේ / හදවතට කාවදී වැනි ආසන්න අදහසක් .....
(ආ) මලක ඇති මෘදු සිනිඳු බව හා මොළොක් බව ද පිනි බිඳුවක ඇති පිරිසිදු බව ද එකතු වී මගේ පුතුගෙ හදවතෙහි එම ගුණ සදාකල්හි ලැගුම් ගනී / හදවතෙහි තැන්පත් වේ.

(iii) (අ) සෙදින = ඉක්මනින් / හනික / වහාම
නරකැල = මිනිසුන් / මිනිස් / සමූහයා
(ආ) සිංහබාහු ගල්ලෙන ඇරීමෙන් පසු සිංහබාහු, සුප්පා දේවිය හා සිංහසීවලී යන අය ලෙන අතහැර ගොස් ඇති බව දැන ගැනීමෙන් ....

(iv) (අ) කලදෝ දියෙන් = රිදීවන් ජලයෙන්
පුලින තලා = වැලිතලා
(ආ) කඳු බෑවුමක සිට දං බෝවිටියා වැනි පඳුරු පොඩිකරගෙන / තලාගෙන, පරමල්පෙති ඉවතට නොදමා පහළට ඇදෙමින් රිදීවන් ජලයෙන් රන් පැහැති වැලිතලා පොගවමින් සංගීතමය තාලයකට ඉදිරියට ගලා යමි.

(v) (අ) පටහැනිවීම = විරුද්ධ වීම
යුක්ත නොවෙයි = සුදුසු නොවෙයි

3, 4 ප්‍රශ්න සඳහා උදාහරණ වලට ලකුණු 04 බැගින් ද, විචාරයට ලකුණු 11 බැගින් ද පිරිනමන්න. $\overline{4}$ $\overline{11}$ අදාළ උධෘත පාඨ හෝ කවි උදාහරණ ලෙස තිබිය යුතුය.

5, 6, 7 ප්‍රශ්න සඳහා උදාහරණ වලට ලකුණු 03 බැගින් ද, විචාරයට ලකුණු 07 බැගින් ද, $\overline{3}$ $\overline{7}$ අදාළ උධෘත පාඨ හෝ කවි උදාහරණ ලෙස තිබිය යුතුය.